# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 2342/48 - 2023 ජූලි මස 28 වැනි සිකුරාදා - 2023.07.28

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස: (I) වැනි ඡේදය - සාමාන්‍ය

### රජයේ නිවේදන

**1973 අංක 25 දරන ක්‍රීඩා පනත**

1973 අංක 25 දරන ක්‍රීඩා පනතේ 32 (ආ) සහ 33 වගන්ති යටතේ සාදන ලද නියමයන්

ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍ය රොෂාන් රණසිංහ වන මම 1973 අංක 25 දරන ක්‍රීඩා පනතේ 32 (ආ) සහ 33 වගන්ති යටතේ මා වෙත පවරා ඇති බලතල අනුව කරාතේ දෝ ක්‍රීඩාව සඳහා ජාතික සංගමය වන ශ්‍රී ලංකා කරාතේ දෝ සම්මේලනයේ ලියාපදිංචිය වහාම ක්‍රියාත්මක වන පරිදි අත්හිටුවන අතර තාවකාලික කාර්යක්‍රමයක් වශයෙන් එකී සංගමයේ කටයුතු තවදුරටත් පවත්වා ගෙන යාම සඳහා පහත කමිටුව පත් කරමි.

| | | |
|---|---|---|
| 1. | සී.ඒ.ජී. ද සොයිසා මයා | - සභාපති |
| 2. | ආචාර්ය ජයලත් ඉලංගකෝන් මයා | - ලේකම් |
| 3. | එස්.සී. මැදවත්ත මයා | - සාමාජික |
| 4. | වෛද්‍ය ජයන්ති ඒ. නානායක්කාර මිය | - සාමාජික |
| 5. | මහිලිනි මයුරන් මිය | - සාමාජික |
| 6. | කේ.එම්.සී. කුමාර මයා | - සාමාජික |
| 7. | ආර්. දේව කුමාර මයා | - සාමාජික |
| 8. | ඒ.කේ. ශිරෝමා ෆොන්සේකා මිය | - සාමාජික |
| 9. | ඒ.ආර්.එම්. ඉක්බාල් මයා | - සාමාජික |

තවද, ශ්‍රී ලංකා කරාතේ දෝ සම්මේලනයේ නිළවරණය පැවැත්වීම සඳහා 1973 අංක 25 දරන ක්‍රීඩා පනත සහ වලංගු ක්‍රීඩා නියෝග අනුව එම සම්මේලනයෙහි විශේෂ මහා සභා රැස්වීමක් කැඳවා එමගින් නිළවරණ කමිටුවක් පත් කිරීම ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් මගින් සිදු කිරීමටත් නිළවරණ කමිටුව මගින් නිළවරණය කැඳවීම හා පැවැත්වීම අධ්‍යක්ෂ ජනරාල්ගේ අධීක්ෂණය යටතේ සිදු කිරීමටත් බලය පවරමි.

**රොෂාන් රණසිංහ** (පා.ම),
ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍ය.

2023 ජූලි මස 28 වැනි දින,
කොළඹ දී ය.

EOG 07 - 0278

1A - G 39994 — 07 (2023/07)      ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

මෙම අති විශේෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.